ෆේස්බුක් හරහා පුද්ගලයින්ට තර්ජනය කරමින් මුදල් ලබාගෙන ඇතැයි පැවසෙන සිදුවීමක තොරතුරු පසුගිය ඉරිදා පුවත්පත් කිහිපයක්ම (මව්බිම 11/07, සිළුමිණ 11/07, සහ දිවයින 11/07) වාර්තා කර තිබිණි.

ඒ අතුරින් මව්බිම පුවත්පතේ එය "විළිසංගෙ නැති ෆොටෝ පිරිමින්ගෙන් ගෙන්නගෙන රිදෙන්නම දුන්න ෆේස්බුක් සුන්දරී" යන සිරස්තලය යටතේ පළවී තිබූ අතර, එහි සිද්ධියට අදාළ ප්‍රධාන සැකකාරිය "මුස්ලිම් ජාතික කාන්තාවක්" ලෙසින් ඉස්මතු කර තිබුණි. එසේම පුවත තුළ ඇගේ නමද සඳහන් කර තිබිණි.

මාධ්‍ය ආචාර ධර්ම නිර්දේශයන්ට අනුව, යම් පුද්ගලයෙකුගේ වාර්ගිකත්වය හෝ ආගම වැනි තොරතුරු දැක්විය යුත්තේ එම පුවතට ඍජුවම අදාළ වන්නේ නම් පමණි. නමුත් මව්බිම පුවත් වාර්තාව තුළ එම සැකකාරියගේ වාර්ගිකත්වය "මුස්ලිම්" යනුවෙන් දක්වමින්, ඍණාත්මක සන්දර්භයක් තුළ එය ඉස්මතු කොට තිබිණි. එම පුවතම සිළුමිණ හා දිවයින පුවත්පත් පළ වී තිබුණේ ඇයගේ වාර්ගිකත්වය ඉස්මතු කර නොදක්වමිනි.

එසේම, මව්බිම සිරස්තලය තුළ "සුන්දරී" ලෙසින් සිදුකර ඇති හැඳින්වීම තුළින්, කාන්තාවකගේ බාහිර රූපය අනවශ්‍ය ලෙස හුවා දැක්වීමක් සිදු නොවන්නේද යන පැනයද ඇසීමට සිදුවේ.

1) මේ අනුව, එක් පුවත්පත් වාර්තාවක් ඔස්සේ පමණක් යම් වාර්ගිකත්වයක් ඍණාත්මක සන්දර්භයක් තුළ ඉස්මතු කොට ඇත්තේ මන්ද?

2) එම පුවත් වාර්තාව තුළ සැකකාරියගේ නමද සඳහන්ව තිබියදී, නැවතත් වාර්ගිකත්වය 'මුස්ලිම්' යැයි සඳහන් වී ඇත්තේ මන්ද?

3) එසේ නම්, මෙම පුවත් අතුරින් ඔබ තෝරාගන්නේ කුමන පුවත් වාර්තාවද?